020

සියලු ම හිමිකම් ඇවිරිණි
මුළු පතිප්පතිප්පුරිමෛයුටෛයතු
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 09 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම/විභාග අංකය :- ................................................................ කාලය: පැය 02 යි.

I කොටස
සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* අංක 01 සිට 20 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සාරවත් කුඹුරකින් ලැබෙන අස්වැන්න මෙන් සැදැහැවතුන්ට පින් නැමැති අස්වැන්න නෙළා ගැනීමට භික්ෂූන් වහන්සේලා උතුම් වූ කුඹුරකි. මෙම අදහස ඇතුළත් සඟ ගුණය කුමක් ද?

(1) පාහුනෙය්‍යා (2) දක්ඛිණෙය්‍යා
(3) ආහුනෙය්‍යා (4) අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස

(02) වේරංජා වස් කාලය තුළදී නිසි අහරක් නොලැබීම හා චිංචි මාණවිකාවගේ සහ අක්කෝසක භාරද්වාජ ආදීන්ගේ නින්දා අපහාස හමුවේ නොසැලීමෙන් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කළේ,

(1) සමානාත්මතාවයයි. (2) අකම්පිත බවයි
(3) කාරුණික බවයි. (4) නම්‍යශීලීත්වයයි.

(03) සම්පූර්ණ මිනිසකු වීමට ද, අවසානයෙහි සංසාරික විමුක්තිය ලබාගැනීමට ද මනසෙහි දියුණුව අත්‍යවශ්‍ය වේ. බුදු දහම අනුව මනසෙහි ශක්තිමත් බව වර්ධනය කර ගැනීමට නම්,

(1) ඉගෙනගත යුතු ය. (2) භාවනා කළ යුතු ය.
(3) ශක්තිජනක ආහාර ගත යුතු ය. (4) පොත් පත් කියවිය යුතු ය.

(04) වස් විසූ භික්ෂුණියක විසින් භික්ෂු භික්ෂුණී යන උභතෝ සංඝයා ඉදිරියේ වස් පවාරණය කළ යුතු ය. මෙය,

(1) සප්ත අපරිහානිය ධර්ම තරුණකි. (2) අෂ්ට ගරු ධර්ම තරුණකි.
(3) දස රාජ ධර්මයට අයත් කරුණකි. (4) දස අකුසල වස්තුවට අයත් කරුණකි.

(05) භික්ෂුණීන් වහන්සේලා වැඩ වාසය කරන ආරාමයකට භික්ෂූන් වහන්සේලාට වැඩම කිරීම තහනම් වූ නමුත් රෝගී වූ භික්ෂුණියකට සෙත් පැතීමට වැඩම කිරීම සඳහා අවසර දෙන ලෙස ඉල්ලීමක් කළේ,

(1) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය (2) භද්දකච්චානා තෙරණිය
(3) ඛේමා තෙරණිය (4) උප්පලවණ්ණා තෙරණිය

(06) පිය රජතුමාගේ ආරාධනාවකට අනුව බුදු රජාණන් වහන්සේගේ කිඹුල්වත්පුර ගමන සිදු වූයේ බුද්ධත්වයෙන්,

(1) පළමු වර්ෂයේ දී ය. (2) දෙවන වර්ෂයේ දී ය.
(3) තෙවන වර්ෂයේ දී ය. (4) සිව්වන වර්ෂයේ දී ය.

(07) අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇතිවූවක් සේ සලකා සතුටට පත්වීම

(1) මෛත්‍රියයි. (2) කරුණාවයි. (3) මුදිතාවයි. (4) උපේක්ෂාවයි.

(08) ත්‍රිකෝටි පාරිශුද්ධියට අයත් නොවන කරුණ වන්නේ,

(1) පව්කම් නොකිරීම (2) පව්කම් නොකරවීම

(3) පියල්ල අනුමත කිරීම (4) අන් අය පව්කම් කරන විට අනුමත නොකිරීම

(09) දුකට මුල්වන තෘෂ්ණාව මුළුමනින් ම නැති කිරීම සහ සියලු කෙලෙස් මුලිනුපුටා දැමීම අර්ථ ගැන්වෙන්නේ,

(1) දුක්ඛ ආර්ය සත්‍යයෙනි. (2) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයෙනි.

(3) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයෙනි. (4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයෙනි.

(10) බුදු දහම තුළ පෞද්ගලික සුභ සිද්ධිය උදෙසා අදාළ කරගත හැකි ප්‍රායෝගික ඉගැන්වීමක් නොවන්නේ මින් කුමක් ද?

(1) පස්පවින් වැළකීම (2) දස අකුසලයෙන් වෙන්වීම

(2) පරාභව කරුණුවලින් බැහැර වීම (4) නියත මිත්‍යා දෘෂ්ටියෙන් යුක්ත වීම

(11) සීල, සමාධි, ප්‍රඥා යනු,

(1) ත්‍රි ශික්ෂාවයි. (2) ත්‍රිලක්ෂණයයි.

(3) ත්‍රිකෝටි පාරිශුද්ධියයි. (4) තිසරණයයි.

(12) ප්‍රාණඝාත අකුසලයෙන් වැළකීම, සත්ත්ව ජීවිත ආරක්ෂා කිරීම, අන්සතු දේ ආරක්ෂා කිරීම, ශිෂ්ට සම්මත පවුල් ජීවිත ගත කිරීම යන නිවැරදි ක්‍රියාවල යෙදීම අයත් වන්නේ,

(1) සම්මා ආජීවයට ය. (2) සම්මා වායාමට ය.

(3) සම්මා කම්මන්තයට ය. (4) සම්මා සමාධියට ය.

(13) සුන්දරී පරිබ්‍රාජිකාව මුල්කොට ගත් සිද්ධියට බුදුරජාණන් වහන්සේට මුහුණදීමට සිදුවූයේ,

(1) පෙර භවයකදී නන්ද නම් ශ්‍රාවකයන් වහන්සේනට ''කාම භෝගියා'' යැයි දොස් නැගීම නිසා

(2) මුනාලි නම් ධූර්තයකුව ඉපද සිටිය දී සරභූ නම් පසේ බුදුන්ට කළ අපහාසය නිසයි.

(3) පෙර භවයක දී ඥාතීන් විසින් මසුන් ගොඩ දා තිබෙනු දැක සතුටු සිනා පහළ කළ නිසයි.

(4) රෝගී සිටුවරයකු පිළිබඳ ද්වේෂයෙන් විරේක බෙහෙත් දී මුදල් ලබාගත් නිසයි.

(14) පටිච්ච සමුප්පාද දහමෙහි "මෙය නැති කල්හි මෙය නැත" යන අර්ථය දැක්වෙන පාළි පාඨය

(1) "ඉමස්මිං සති ඉදං හෝති" යන්නයි. (2) "ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති" යන්නයි.

(3) "ඉමස්මිං අසති ඉදං න හෝති" යන්නයි. (4) "ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති" යන්නයි.

(15) දෙවන ධර්ම සංගායනාවෙහි ප්‍රතිඵලයක් වන්නේ,

(1) දුර්මතධාරී භික්ෂූන් වහන්සේලා පැවි දහසක් පසුගෙනත් නෙරපා හැරීම

(2) පොහොය කර්ම ආදිය සාමූහිකව සිදු කිරීමට භික්ෂූන් වහන්සේලාට හැකියාව ලැබීම

(3) කථාවත්ථුප්පකරණය නම් ග්‍රන්ථය රචනා කොට අභිධර්ම පිටකයට ඇතුළත් කිරීමට හැකි වීම

(4) වජ්ජිපුත්තක භික්ෂූන් විසින් පිළිගන්නා ලද දස වස්තුව විනය විරෝධී යැයි සංඝ සම්මුතියෙන් ප්‍රතික්ෂේප කිරීම

(16) මහියංගන චෛත්‍යය, තිවංක පිළිම ගෙය, ලංකාතිලක විහාරය, දිඹුලාගල ආදී ස්ථානවල ඇති චිත්‍ර අයත්වන යුගය නම්

(1) අනුරාධපුර යුගය
(2) පොළොන්නරු යුගය
(3) දඹදෙණි යුගය
(4) මහනුවර යුගය

(17) අවම බලාපොරොත්තු ඇතිව ලද දෙයින් පමණක් සතුටු වී පහසුවෙන් පෝෂණය කළ හැකි සැහැල්ලු වාම ජීවිත ගත කිරීම බුදු දහම් හඳුන්වන්නේ,

(1) සමජීවිකතාවය යනුවෙනි.
(2) මහිච්ඡතාව යනුවෙනි.
(3) අල්පේච්ඡතාව යනුවෙනි.
(4) මිථ්‍යා ආජීවය යනුවෙනි.

(18) රටක පාලකයා සිය ධනය, කාලය, කායික මානසික ශ්‍රමය සුව පහසුව රටේත් ජනතාවගේත් යහපත සඳහා කැප කිරීම අර්ථවත් වන රාජ ධර්මය නම්,

(1) දානයයි.
(2) මෘදු බවයි.
(3) පරිත්‍යාගයයි.
(4) සීලයයි

(19) බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය පිළිබඳ විචාරශීලීව පදනම් සහිතව සම්බුද්ධ ප්‍රසාදය මත ඇතිවන ශ්‍රද්ධාව

(1) අමූලිකා ශ්‍රද්ධාව නම් වේ.
(2) ආකාරවතී ශ්‍රද්ධාව නම් වේ.
(3) අධිගම ශ්‍රද්ධාව නම් වේ.
(4) ආගම ශ්‍රද්ධාව නම් වේ.

(20) දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං
අක්කෝධං අවිහිංසඤ්ච - ඛන්තිඤ්ච අවිරෝධනං
ඉහත පාලි ගාථාවෙන් විස්තර වන්නේ,

(1) දස පාරමිතාවන් ය.
(2) දස කුසල ක්‍රියාවන් ය.
(3) දස අකුසල ක්‍රියාවන් ය.
(4) දස රාජ ධර්මයන් ය.

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (i) ස්තූප තනා පිදිය යුත්තන් සිව්දෙනකු පිළිබඳව බුදුරජාණන් වහන්සේ දක්වා ඇත. ඉන් දෙදෙනකු නම් කරන්න.

(ii) බුදුරජාණන් වහන්සේගේ අවසන් බුද්ධ වචනය පාලි භාෂාවෙන් හෝ සිංහල භාෂාවෙන් ලියන්න.

(iii) නායකයකු වශයෙන් බුදුරජාණන් වහන්සේ ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව ක්‍රියාකර ඇත. එයට නිදසුන් දෙකක් ලියන්න.

(iv) අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥාවෙන් යුතුව සාධු ප්‍රතිපත්තියෙහි යෙදෙන සංඝරත්නය හඳුන්වන සංඝ ගුණය නම් කරන්න.

(v) ආනාපානසති භාවනාව වැඩීමේ දී පිරිමි දරුවන් සිටිය යුතු ආකාරය නම් කරන්න.

(vi) හිරි ඔත්තප්පය හඳුන්වන තවත් ආකාර දෙකක් ලියන්න.

(vii) බුදු රජාණන් වහන්සේගේ උර්ණ රෝම ධාතුව නිදන් කර ඇති උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි පිහිටා ඇති චෛත්‍යය කුමක් ද?

(viii) සියලු සංස්කාරයන් සංසිඳීම සියලු බැඳීම් අත්හැරීම, තෘෂ්ණාව සපුරා නැති කිරීම, ආදිය බුදු දහමෙහි හඳුන්වන්නේ කෙසේ ද?

(ix) සම්මා වායාමයට අයත් දුකින් මිදීම සඳහා වන සිව්වැදෑරුම් උත්සාහයන්ගෙන් දෙකක් ලියන්න.

(x) තෙවන ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) සීලයෙහි මූලික ප්‍රභේද දෙක ලියන්න. (ලකුණු 02)

(ii) අත්තූපනායික ධර්ම පර්යාය යනු කුමක්දැයි කෙටියෙන් ලියන්න. (ලකුණු 03)

(iii) ලැජ්ජා භය හේතු කොටගෙන අප සිල්වත් වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

(03) (i) පුද්ගලයකුගේ කායික මානසික නීරෝගීතාවයට අදාළ වන පන්සිල් පද දෙක ලියන්න. (ලකුණු 02)

(ii) ආහාර ගැනීමෙන් අප බලාපොරොත්තු වන ප්‍රධාන කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) නීරෝගී දිවිපෙවෙතක් උදෙසා සුදුසු ආහාර ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) මිථ්‍යා වාචා හෙවත් වචනයෙන් සිදුවන වැරදි හතරෙන් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) සම්මා ආජීවයට අනුව ධාර්මිකව ජීවිතය ගොඩනගා ගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) අටලෝ දහමට අයත් අංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) මහා මංගල සූත්‍රයේ අටලෝ දහමින් කම්පා නොවී ජීවත්වීම මංගල කරුණක් ලෙස දක්වා ඇති පාලි ගාථාව ලියන්න. (ලකුණු 03)

(iii) පාසල් දරුවන් වන ඔබට ද අටලෝ දහමට මුහුණ දීමට සිදුවන අවස්ථා ඇත. එවන් අවස්ථාවකදී ඔබ ක්‍රියාකරන ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) සිදුහත් කුමරු වප් මඟුල් දිනයේ දඹරුක් සෙවණේ දී වඩන ලද භාවනාව නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔබ නම් කරන ලද භාවනාවට සූදානම් වන ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 03)

(iii) භාවනාව වැඩීමෙන් පාසල් ශිෂ්‍යයෙකුට ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) මහා ප්‍රජාපතී ගෝතමී දේවිය (ලකුණු 05)

(ii) බෞද්ධ කලාව (ලකුණු 05)

(iii) සම්බුද්ධ පරිනිර්වාණය (ලකුණු 05)

(iv) ධම්මපදය (ලකුණු 05)